# මිහිඳු සංස්කෘතිය හා බෞද්ධ අධ්‍යාපනය

පූජ්‍ය වීරකැටියේ චන්ද්‍රානන්ද හිමි*

මහින්දාගමනයෙන් සිංහල සංස්කෘතියෙහි ආරම්භය හා විකාශනය වීමෙන් මහා මහින්ද ස්ථවිරයන් විසින් ලක්දිවට බෞද්ධාගම හඳුන්වා දීමත් අතිශය වැදගත් ස්ථානයක් ගනියි. මෙම ඓතිහාසික සිද්ධිය ක්‍රි. පූ. 280 - 250 අතර කාලයේ ලක් රජය කළ දේවානම්පියතිස්ස රාජ්‍යය කාලයට අයත් බව දීපවංසය, මහාවංසය, නිකාය සංග්‍රහය, සමන්තපාසාදිකාව සාක්ෂ්‍ය දරයි. එම ඓතිහාසික සිද්ධිය සිංහල සාහිත්‍යය කෙරෙහි පමණක් නොව සිංහල සංස්කෘතිය කෙරෙහි ද බල පෑ ආකාරය වටහා ගැනීමෙහි ලා මහෝපකාරී වෙයි. බුදු දහම පැතිර යාමත් සමගම අධ්‍යපනයෙහි විශේෂයෙන් ම බෞද්ධ ආගමික අධ්‍යාපනයෙහි අවශ්‍යතාවයද එකල වැඩ සිටි මහතෙරවරුන්ට වෙසෙසින් අවබෝධ විය. එකල අධ්‍යාපනය භාරව සිටියෝ භික්ෂූහුය. අධ්‍යාපනයෙහි කේන්ද්‍රස්ථානය වූයේ පන්සල මුල් කොට ගත් පිරිවෙණයි. එහි අධ්‍යාපනය ලැබුවෝ පැවිදි පක්ෂය පමණක් නොව ගිහි අයද සිටියහ. කෙසේ වෙතත් මෙම අධ්‍යාපන ක්‍රමය බෙහෙවින්ම ආගමික අධ්‍යාපනයට බරව පැවති බව පෙනෙයි. එකල පැවති අධ්‍යාපන ක්‍රමයෙහි විශේෂ තැනක් හිමි වූයේ ආත්ම සමයට ය. එය අප සාහිත්‍යයෙහි ද කලා ශිල්ප වලද බෙහෙවින් කැපී පෙනෙන ලකක්ෂණයකි. මිහිඳු හිමියන් විසින් ලක්දිව බුදු සසුන පිහිටුවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් එකල අධ්‍යාපන ක්‍රමය ද චිරන්තන සාහිත්‍ය කෙරෙහි බල පා ඇති අයුරු වෙසෙසින් විමර්ශනය කළ යුතුය. එකල අධ්‍යාපනයේ මූලික අරමුණක් වූයේ ගුණ නුවණ හා ආධ්‍යාත්මික දියුණුවයි. මජ්ඣිමනිකායට්ඨකථාවේ එන කතා පුවත් මීට කදිම නිදසුන්ය. ඒ අතරින් කාලදීඝවාපිද්වාර විහාරාධිපති තම ශිෂ්‍යයාට ගමෙහි හැසිරීම නවත්වනතුරු ඉගෙනීමට අවසර නොදුන් හ. මෙසේ සලකා බලන විට පැරණි අධ්‍යාපන ක්‍රමය මුළුමනින්ම භික්ෂුන් අතර පැවති අතර ගිහියන් අතර ද උගත් ගැහැණු පිරිමි සිටි බව පෙනේ. රජයේ ඇමතිවරු ද බෙහෙවින්ම උගත් පාණ්ඩිත්‍යයෙන් යුත් පිරිසක් විය. ශාස්ත්‍රීය කටයුතු කෙරෙහිද ඔවුන් මැදිහත් වූයේ සිය අතෙහි තිබූ දේශපාලන බලය නිසා නොව, ඔවුන් තුළ පැවති ශාස්ත්‍රීය හා ආධ්‍යාත්මික සුදුසුකම් නිසාය. මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් මිහිඳු සංස්කෘතිය හා බෞද්ධ අධ්‍යාපනය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණය.

ප්‍රමුඛ පද: අධ්‍යාපනය, ආධ්‍යාත්මික, පිරිවෙණ, මජ්ඣිමනිකායට්ඨකථා, මහින්දාගමනය.

* කැලණිය විශ්වවිද්‍යාලය, wcnanda90@gmail.com